# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## සුරාබදු (සංශෝධන)

**(52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා විසින්
2013 මාර්තු මස 08 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2013 පෙබරවාරි මස 26 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[213 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 3.00 යි** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින් (52 වන අධිකාරය වූ) සුරාබදු ආඥා පනතේ 15 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, පොල් ගස් මැදීම හා පොල් ගස් වලින් රා නිස්සාරනය කිරීම සඳහා බලපත්‍ර ලබාගැනීම සම්බන්ධයෙන් නිදහස් කිරීමක් ප්‍රදානය කිරීම වේ.

එල්.ඩී.—ඕ. 8/2013.

**(52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.*

**1.** මේ පනත 2013 අංක    දරන සුරාබදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර එය 2012 නොවැම්බර් මස 08 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

*52 වන අධිකාරයේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.*

**2.** 2011 අංක 20 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත (52 වන අධිකාරය වූ) සුරාබදු ආඥා පනතේ 15 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි (ආ) ඡේදයේ "කිතුල් ගස් සහ" යන වචන වෙනුවට "කිතුල් ගස්, පොල් ගස් සහ" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) එහි (ඇ) ඡේදයේ "කිතුල් ගස් සහ" යන වචන වෙනුවට "කිතුල් ගස්, පොල් ගස් සහ" යන වචන ආදේශ කිරීමෙන්.

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.*

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.